සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

**51 S I**

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................

# චිත්‍ර I

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

**උපදෙස්**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
  - **I කොටස** - වරණ 5 බැගින් බහුවරණ ප්‍රශ්න 40 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
    - එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 40 කි.
  - **II කොටස** - මෙම කොටස ''අ'', ''ආ'', ''ඉ'' යනුවෙන් අනු කොටස් තුනකින් සමන්විත වේ.
    - ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''ආ'', ''ඉ'' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
    - එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60 කි.
- **I** කොටස හා **II** කොටසට අදාල පිළිතුරුපත් එකට අමුණා භාර දෙන්න.

## I කොටස


- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් **A, B, C, D, E** යන ඡායාරූප ඇසුරෙන් තෝරන්න.




**A**



**B**



**C**



**D**



**E**

01. A අක්ෂරයෙන් දැක්වෙන්නේ,
    1. විවිධ සංකේත එකතු වූ නව නිර්මාණාත්මක සඳකඩපහනකි.
    2. මහනුවර යුගයේ ලක්ෂණ සහිත දළදා මාලිගයේ සඳකඩපහනයි.
    3. අනුරාධපුර යුගයේ ලක්ෂණ සහිත බිසෝමාලිගයේ සඳකඩපහනයි.
    4. පොළොන්නරු යුගයේ ලක්ෂණ සහිත වටදාගෙයි සඳකඩපහනයි.
    5. පොළොන්නරුවේ රාජ සභා මණ්ඩපය ඉදිරිපස දොරටුවේ ඇති සඳකඩපහනයි. (.....)

02. B අක්ෂරයෙන් දැක්වෙන දරුවාට කිරි පොවන මව කැටයම,
    1. කල්පිත මෝස්තර සහිත අර්ධ උන්නත කැටයමකි.
    2. සමකාලීන සමාජ ජීවිතය සම්බන්ධ අර්ධ උන්නත කැටයමකි.
    3. කල්පිත මෝස්තර සහිත අල්ප උන්නත කැටයමකි.
    4. සමකාලීන සමාජ ජීවිතය සම්බන්ධ අල්ප උන්නත කැටයමකි.
    5. නිර්ජීවී මෝස්තර සහිත අර්ධ උන්නත කැටයමකි. (.....)

03. C අක්ෂරයෙන් දැක්වෙන කැටයම,
1. දෙවනපෑතිස් රජතුමා විසින් කරවන ලද අනුරාධපුර යුගයට අයත් ඉසුරුමුණියේ කැටයමකි.
2. මහා පරාක්‍රමබාහු රජතුමා විසින් කරවන ලද පොළොන්නරුවේ ඇති කැටයමකි.
3. නිශ්ශංකමල්ල රජතුමා විසින් කරවන ලද පොළොන්නරු යුගයට අයත් කැටයමකි.
4. මහා පරාක්‍රමබාහු රජතුමා විසින් කරවන ලද අනුරාධපුර යුගයට අයත් කැටයමකි.
5. සාමාන්‍ය ජන ජීවිතයේ සිද්ධීන් පෙන්නුම් කරන ගම්පොල යුගයේ කැටයමකි. (.....)

04. D අක්ෂරයෙන් දැක්වෙන කැටයම වන්නේ,
1. මාමල්ලපුරම් දුර්ගා කෝවිලේ විමානයෙන් උපුටා ගන්නා ලද කොටසකි.
2. අජන්තා ගුහාවේ දක්නට ලැබෙන ගුප්ත යුගයේ පුවරු කැටයමක කොටසකි.
3. කෛලාසනාථ කෝවිලේ එක් පුවරු කැටයමකින් උපුටා ගන්නා ලද්දකි.
4. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ හමුවන පශුපති නැමති ශිවගේ මූලා දර්ශයේ කොටසකි.
5. සංචි ස්තූපයේ තොරණේ කැටයම් අතර හමුවන කොටසකි. (.....)

05. E අක්ෂරයෙන් දැක්වෙන කැටයම,
1. ඩේසියානු යුධ ජයග්‍රහණ සැමරීමට ටයිටස් අධිරාජ්‍යයා විසින් ඉදිකල ආරුක්කු කැටයමකි.
2. නාමර් රජුගේ යුධ ජයග්‍රහණයක් දැක්වෙන සංකේතාත්මක ඵලකයකි.
3. ඩේසියානු යුධ ජයග්‍රහණ සැමරීමට ට්‍රැජන් අධිරාජ්‍යයේ ට්‍රැජන් කුළුණු කැටයමකි.
4. සටන් දර්ශන සහිත කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා කල කැටයමකි.
5. ටයිටස් අධිරාජ්‍යයා විසින් තම යුධ ජයග්‍රහන දැක්වීමට කල කැටයමකි. (.....)

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

06. සැලසුම් මූලධර්මයක් නොවන්නේ,
1. රිද්මය 2. සමබරතාවය 3. ඓතිහාසික බව
4. සුසංගත බව 5. අවශ්‍යතාවය (.....)

07. පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කිරීමේදී නොකල යුතු දෙයකි.
1. තලය, අවකාශය, සංකේතරූප, අක්ෂර, වර්ණ තේමාවට, භාවිතා කිරීම.
2. දෙනු ලබන පණිවිඩය නිරවුල් හා වේගවත්ව සන්නිවේදනය කිරීම.
3. විවිධ කාරනයන්හිදී රූප හා වර්ණ සංකේතාත්මකව භාවිත කිරීම.
4. පෝස්ටර් චිත්‍රයක් සැලසුම් කිරීමේදී ජ්‍යාමිතික උපකරණ භාවිත නොකිරීම.
5. තේමාවට අදාලව සැලසුම් කිරීමේදී දළ සැලසුම ඇඳීම. (.....)

08. මුළුතල සැරසිල්ලක් යනු,
1. වෙන්කරගත් නිශ්චිත සීමාවක් තුළ කරනු ලබන සැරසිල්ලය.
2. මුළු හතරක් පමණක් යොදාගෙන කරනු ලබන සැරසිලිය.
3. මුළු හතර ඉවත්කර කරනු ලබන සැරසිලිය.
4. පාරම්පරික සැරසිලි ක්‍රමය යොදාගෙන කරනු ලබන සැරසිලිය.
5. පිත්තල කර්මාන්තයේදී පමණක් සිදුකරනු ලබන සැරසිලිය. (.....)

09. ද්‍රව්‍ය බලා ඇඳීමේ අභ්‍යාසයක් සිදුකිරීමේදී අඩංගු නොවිය යුතු පියවරකි.
1. පරිමාව, පරිමාණ ලක්ෂණ, පර්යාවලෝක ලක්ෂණ ගැන සැලකිලිමත් වීම.
2. ශිල්පියාගේ දක්ෂතාවය හා අධ්‍යාපන මට්ටම වැදගත්වීම.
3. ද්‍රව්‍යවල විවිධත්වය - මතුපිට ස්වභාවය මතුවන සේ වර්ණ ගැන්වීම.
4. වර්ණ මාධ්‍යයට උචිත ශිල්ප ක්‍රම භාවිතය.
5. ද්‍රව්‍ය සම්පිණ්ඩනයට උචිත පරිදි පසුබිමට වර්ණ යොදා අවසන් කිරීම. (.....)

10. දෘශ්‍ය කලා මූලිකාංග වඩාත් නිවැරදිව දක්නට ලැබෙන්නේ,
1. රේඛාව, වර්ණය, හැඩය, අවකාශය, වයනය, ආකෘතිය
2. වර්ණය, රේඛාව, ස්ථිර බව, අවකාශය, වයනය, ආකෘතිය
3. හැකියාව, වර්ණය, රේඛාව, හැඩය, අවකාශය, ආකෘතිය
4. වර්ණය, පසුබිම, රේඛාව, හැඩය, අවකාශය, ආකෘතිය
5. රේඛාව, තලය භාවිතය, ආකෘතිය, පසුබිම, අවකාශය (.....)

- **අංක 11 සිට 15 තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර පහත අංක 01 සිට 07 දක්වා නම් කර ඇති ඡායාරූප ඇසුරෙන් තෝරන්න.**



1



2



3



4



5



6



7

11. ශාස්ත්‍රාලීය යථාර්ථවාදී කලා ආභාෂය සහිත ලාංකේය සිතුවම් වන්නේ,
1. 3, 6, 5  2. 1, 4, 2  3. 2, 5, 7  4. 6, 7, 1  5. 3,5,7  (.....)

12. යුරෝපීය ක්‍රමවේද බහුලව භාවිත කර ඉන්දීය වස්තුවිෂයට නැඹුරුව ඇඳි සිතුවම් වන්නේ,
1. 6,7  2. 1,7  3. 3,7  4. 5,7  5. 1,3  (.....)

13. කිතුනු දහම තේමා කරගත් ලාංකේය සිත්තරකුගේ සිතුවම් වන්නේ,
1. 2,6  2. 3,5  3. 6,7  4. 1,3  5. 2,4  (.....)

14. ශාස්ත්‍රාලීය යථාර්ථවාදය, රොමෑන්තිකවාදය, පෙරදිගවාදය පිළිබඳ විශ්වාස, ශෛලිය සහ ආභාෂය ගුරු කොටගත් අමරසේකර මහතාගේ සිතුවම් වන්නේ,
1. 6,7  2. 4,5  3. 2,7  4. 1,3  5. 2,4  (.....)

15. ජේ.ඩී.ඒ. පෙරේරා ශිල්පියාගේ සිතුවමකි.
1. 1  2. 6  3. 4  4. 5  5. 7  (.....)

- **අංක 16 සිට 20 තෙක් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

16. ඉන්දු නිම්න වාස්තු විද්‍යා නිර්මාණවල විශේෂතා නොවන්නේ,
1. ප්‍රභූ නිවාස සාමාන්‍ය නිවාසවලට වඩා විශාලය.
2. සාමාන්‍ය ජනයාගේ නිවාස දොරටු ප්‍රධාන මාර්ගයට මුහුණලා නොමැත.
3. නිවාස පේළියක නිවාස 20ක් 25ක් පමණ ඇත.
4. නිවාස පේළියකට පොදු ළිඳක් වැසිකිළියක් වූ බව පෙනේ.
5. ඇතුලත බිත්ති මැටි බදාම යොදා චාම්ව නිමකර ඇත.  (.....)


17. ඉන්දු නිම්න කලා නිර්මාණ අතර මුද්‍රා 2000 කට වැඩි ප්‍රමාණයක් සොයා ගෙන ඇත. ඒවා අතර ඇති මුද්‍රා වන්නේ,
1. ගවරූප  2. යෝගාසන දේවරූපය  3. රුක් දෙවියන්
4. ව්‍යාඝ්‍රයන් දෙදෙනෙකු සමඟ සටන් කරන මිනිසා  5. හිස නැති කවන්ද රූපය  (.....)


18. ලංකා කලා සංගමයේ ශිල්පීන්ගේ ප්‍රධාන අරමුණ වන්නේ,
1. ශාස්ත්‍රාලයීය කලා සම්ප්‍රදාය ශ්‍රී ලාංකික කලා ක්ෂේත්‍රයේ ආයතනගත කිරීමය.
2. බටහිර ආකෘතිවලින් මිදී දේශීය කලා ආරක් ගොඩනැගීමය.
3. සාම්ප්‍රදායික චිත්‍ර කලාව ගොඩනැංවීමය.
4. 43 වන කණ්ඩායම සමඟ විරුද්ධ මතවාද ඉදිරිපත් කිරීමය.
5. ඉන්දියානු කලා ආරක් ලංකාව තුළ ගොඩනැංවීමය.  (.....)


19. සිතුවම් සඳහා බොහෝ විට රතු, කහ, සුදු, කළු සහ අළු භාවිත කර ඇති අතර වර්ණ මිශ්‍ර කර භාවිත කර ඇති විශේෂත්වය දක්නට ඇති ගුහාව වන්නේ,
1. ෂෝවේ ගුහාව 2. ඇල්ටමීරා ගුහාව 3. ෆොන්ඩිගෝම් ගුහාව
4. ලැස්කෝ ගුහාව 5. කෝගුල් ගුහාව (.....)

20. අන්ග්ලෝ - ඉන්දියානු සම්ප්‍රදාය ලෙස විචාරකයින් හඳුන්වනු ලැබූ දෘශ්‍ය භාෂාව භාවිත කල ශිල්පියා වන්නේ,
1. ගනේෂ්වරාචාර්ය ශිල්පියා 2. නාරායනස්වාමි ශිල්පියා 3. කේ. කනකසභාපති ශිල්පියා
4. රාජා රවිවර්මා ශිල්පියා 5. සී. සිවඥානසුන්දරම් ශිල්පියා (.....)

- **අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණ ඇසුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

21. මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,

1. භික්ෂූන් වහන්සේලාගේ පොහොය කර්ම සිදු කිරීමට භාවිත කරන ලද්දකි.
2. පරිසර අලංකරණය සඳහා යොදාගනු ලැබූ වාස්තු විද්‍යා අංගයකි.
3. රජවරු ස්නානය සඳහා යොදා ගත්තකි.
4. රජබිසෝවරු ස්නානය සඳහා යොදා ගත්තකි.
5. ආරාමවාසී භික්ෂූන් ස්නානය සඳහා භාවිත කරන ලද්දකි. (.....)

22. මෙම රූපයෙන් දක්නට ලැබෙන්නේ,

1. පාරාවෝවරුන්ගේ උත්තරීතරභාවය පෙන්වන කුෆු පිරමීඩයයි.
2. පාරාවෝවරුන්ගේ උත්තරීතරභාවය පෙන්වන කාෆ්රේ පිරමීඩයයි.
3. පාරාවෝවරුන්ගේ උත්තරීතරභාවය පෙන්වන අබුසිම්බල් දේවස්ථානයයි.
4. ලුක්සෝර් දේවස්ථානයයි.
5. මස්ටාබා සොහොන් ගෙයකි. (.....)

23. මෙහි දැක්වෙන ජල තාටකය (නාන තටාකය)

1. ඉන්දු නිම්න වාස්තු විද්‍යාත්මක නිර්මාණවලට අයත්ය.
2. ලාංකේය වාස්තු විද්‍යාත්මක නිර්මාණවලට අයත්ය.
3. යුරෝපීය වාස්තු විද්‍යාත්මක නිර්මාණවලට අයත්ය.
4. සුංග හා සතවාහන යුගයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණවලට අයත්ය.
5. මෞර්ය යුගයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණවලට අයත්ය. (.....)


24. මෙහි දක්නට ලැබෙන්නේ,


1. ලෞරියානන්දන්ගර් ශීර්ෂ ස්තම්භය. 2. රාම්පූර්වා ස්තම්භය.
3. සාරානාත් ස්තම්භය. 4. භාරුත් කැටයම්වල ශීර්ෂයකි.
5. සාංචි තොරණේ කුළුණු ශීර්ෂයකි. (.....)


25. මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,


1. රන්කොත් වෙහෙරයි. 2. කිරිවෙහෙරයි.
3. හඟුරන්කෙත පොත්ගුල් විහාර ස්තූපයයි. 4. අභයගිරියයි.
5. පොළොන්නරුව පොත්ගුල් විහාර ස්තූපයයි. (.....)


- අංක 26 සිට 30 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් **F, G, H, I , J** ලෙස නම් කර ඇති මූර්ති ඇසුරෙන් තෝරන්න.


**F**


**G**


**H**


**I**


**J**

26. F අක්ෂරයෙන් දැක්වෙන්නේ,
   1. අබුසිම්බල්හි නෙලා ඇති පාරා රජ රූ සමූහයකි.
   2. අබුසිම්බල්හි II රම්සස් රජුගේ මූර්ති සමූහයකි.
   3. පැරණි රාජධානි යුගයේ මිසරයේ නෙළන ලද ශෛලමය ප්‍රතිමා සමූහයකි.
   4. පාරාවරුන්ගේ තෙදබල මහිමය පෙන්වන ප්‍රතිමා සමූහයකි.
   5. ලුක්සෝර් දේවස්ථානයේ වැලිගලින් නෙලා ඇති මූර්තිවේ. (.....)


27. G අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
   1. ස්වභාවිකවාදී ලක්ෂණ සමඟ යථාර්ථවාදී නිරීක්ෂණ පිහිටුවා ඇති මූර්තියකි.
   2. වැලිගලින් පූර්ණ වශයෙන් නෙලා පින්තාරු කල මූර්තියකි.
   3. සනකවාදී ලක්ෂණ සමඟ නිරීක්ෂතා පිහිටුවා ඇති මූර්තියකි.
   4. ව්‍යුක්ත රූපී ලක්ෂණ සහිත මූර්තියකි.
   5. කළුගල් මාධ්‍යයෙන් අර්ධ වශයෙන් නෙලා පින්තාරු කල මූර්තියකි. (.....)


28. H අක්ෂරයෙන් දැක්වෙන ලංකාවේ හොඳම වාස්තු විද්‍යා නිර්මාණය,
   1. රුවන්වැලි මහා සෑයේ වාහල්කඩයි.   2. අභයගිරි විහාරයේ වාහල්කඩයි.
   3. මිහින්තලය කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩයි.   4. මිරිසවැටිය චෛත්‍යයේ වාහල්කඩයි.
   5. ථූපාරාම චෛත්‍යයේ වාහල්කඩයි. (.....)

29. I අක්ෂරයෙන් දැක්වෙන්නේ,
   1. ලෝහ මාධ්‍යයෙන් නිරූපිත සරල හැඩතල සහිත මව් දෙවඟන පිළිමය.
   2. ටෙරාකොටා මාධ්‍යයෙන් සරල හැඩතල සහිත මව් දෙවඟන පිළිමයයි.
   3. ලෝකඩ මාධ්‍යයෙන් පූර්ණ උන්නතව නෙළා ඇති නළඟන රූපයයි.
   4. අළු වැලිගලින් කල කවන්ද රූපයයි.
   5. රතු වැලිගලින් කල කවන්ද රූපයයි. (.....)

30. J අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය,
   1. උපෝසථඝරයකි.   2. පධානඝරයකි.   3. ආසනඝරයකි.
   4. බෝධිඝරයකි.   5. ජන්තාඝරයකි. (.....)

- අංක 31 සිට 35 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර **K, L, M, N, O** ලෙස නම්කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


**K**


**L**


**M**


**N**


**O**

31. K අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
   1. බටහිර ශාස්ත්‍රාලයීය ක්‍රමවේදවලට අනුව ඩේවිඩ් පේන්ටර් ශිල්පියා නිර්මාණයකල සිතුවමකි.
   2. බටහිර ශාස්ත්‍රාලයීය ක්‍රමවේදවලට අනුව සෝලියස් මැන්ඩිස් ශිල්පියාගේ සිතුවමකි.
   3. ස්වාභාවිකවාදීව අඳින ලද J.D.A. පෙරේරා ශිල්පියාගේ නිර්මාණයකි.
   4. ස්වාභාවිකවාදී ක්‍රමවේදවලට අඳින ලද නාරායන ශිල්පියාගේ සිතුවමකි.
   5. බටහිර ශාස්ත්‍රාලයීය ක්‍රමවේදවලට අඳින ලද A.C.G.S. අමරසේකර මහතාගේ සිතුවමකි. (.....)


32. L අක්ෂරයෙන් දැක්වෙන්නේ,
   1. ආලේඛ්‍ය චිත්‍රයක් වන සීතාද සේරම් නැමති චිත්‍රයකි.
   2. A.C.G.S. අමරසේකර ශිල්පියාගේ සිතුවමකි.
   3. නළඟන (චන්ද්‍රලේඛා) නැමති තෙල්සායම් සිතුවමකි.
   4. ආම්රිතා ශර්ගිල්ගේ සිතුවමකි.
   5. ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ සිතුවමකි. (.....)

33. M අක්ෂරයෙන් දැක්වෙන්නේ,
   1. ලාංකේය ශිල්පියෙකු වූ නාරායන ස්වාමිගේ චිත්‍රයකි.
   2. ලාංකේය ශිල්පියෙකු වූ එම්. සාර්ලිස් ශිල්පියාගේ චිත්‍රයකි.
   3. ඉන්දීය චිත්‍ර ශිල්පියෙකු වූ නන්දලාල් බෝස්ගේ චිත්‍රයකි.
   4. ඉන්දීය ශිල්පියෙකු වූ රාජා රවි වර්මා සිතුවමකි.
   5. ඉන්දීය ශිල්පියෙකු වූ අබනීන්ද්‍රනාත් තාගෝර් ශිල්පියාගේ සිතුවමකි. (.....)

34. N අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
1. බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවමකි.
2. නව කැළණි විහාරයේ සිතුවමකි.
3. ගෝතමී විහාරයේ සිතුවමකි.
4. මහනුවර ගංගාරාමයේ සිතුවමකි.
5. මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ සිතුවමකි. (.....)

35. O අක්ෂරයෙන් දැක්වෙන්නේ,
1. තීබ්ස්හි නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවන කුරුළු දඩයම සිතුවමයි.
2. තීබ්ස්හි නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවන නාට්‍යාංගනාවෝ සහ සංගීතඥයෝ සිතුවමයි.
3. සොහොන් දේවස්ථානයක උතුරු බිත්තියේ ඇඳ ඇති සිතුවමකි.
4. තීබ්ස්හි නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවන පාරාවෝවරුන්ගේ සිතුවමකි.
5. සොහොන් ගෙයකින් හමුවන (මස්ටාබා) උතුරු බිත්තියේ ඇඳ ඇති පාරාවරුන්ගේ සිතුවමකි. (.....)

- **අංක 36 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරින් තෝරන්න.**



36. මෙම සිතුවම,
1. J.D.A. පෙරේරා ශිල්පියාගේ උඩුකය චිත්‍රයකි. (ආලේඛ්‍ය)
2. නන්දලාල් බෝස් ශිල්පියාගේ උඩුකය චිත්‍රයකි.
3. A.C.G.S. අමරසේකර ශිල්පියාගේ උඩුකය චිත්‍රයකි.
4. M. සාර්ලිස් ශිල්පියාගේ උඩුකය සිතුවමකි.
5. සෝලියස් මැන්දිස් ශිල්පියාගේ උඩුකය සිතුවමකි. (.....)

37. මෙම සිතුවමෙන් අර්ථවත් වන්නේ,
1. අසුනක් මත ඉඳ සිට පොතක් බලන කාන්තා රූවකි.
2. අසුනක් මත ඉඳ සිට කල්පනාවේ යෙදෙන කාන්තා රූවකි.
3. අසුනක් මත ඉඳ සිට පොතක් ලියන කාන්තා රූවකි.
4. අසුනක් මත ඉඳ සිතුවමක් අඳින කාන්තා රූවකි.
5. ඉහත දක්වන ලද සියල්ලම නොවේ. (.....)

38. මෙම සිතුවම,
1. සනිකාවාදී කලා ආභාෂය ලබා ඇත.
2. ආලෝකානුවාදීව නිර්මාණය කර ඇත.
3. ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී කලා ආභාෂය ලබා ඇත.
4. පශ්චාත් උපස්ථිතිවාදී කලා ආභාෂය ලබා ඇත.
5. උපස්ථිතිවාදී කලා ආභාෂය ලබා ඇත. (.....)

39. මෙම සිතුවමේ වර්ණ භාවිතයේ සුවිශේෂ ශිල්පීය ලක්ෂණය වන්නේ,
1. ස්වභාවික නොවන ලෙස පින්සල් පහරවල් යොදා ගැනීමයි.
2. වේගවත් නොවන පින්සල් පහරවල් යොදා තිබීමය.
3. කඩින් කඩ යෙදෙන පින්සල් පහරවල් යොදා තිබීමයි.
4. දීර්ඝව යෙදෙන පින්සල් පහරවල් යොදා ඇති ශෛලියකින් සිතුවම ගොඩනගා තිබීමයි.
5. තරමක් වේගවත් පින්සල් පරහවල් සහිත ශෛලියකින් සිතුවම ගොඩනගා තිබීමයි. (.....)

40. මෙම සිතුවමින් නිරූපිත සම්පිණ්ඩන ක්‍රමවේදය,
1. චිත්‍රයට ගෝචර වූ පුද්ගලයා කියවීමට කැමැත්තක් හා පොත්පත් සමග ඇති සබැඳියාව පෙන්නුම් කරයි.
2. චිත්‍රයට ගෝචර වූ පුද්ගලයා සිතුවම් ඇඳීමට කැමැත්තක් දක්වන ආකාරයක් පෙන්නුම් කරයි.
3. චිත්‍රයට ගෝචර වූ පුද්ගලයා නිදහසේ සිතීමට කැමැත්තක් දක්වන ආකාරයක් පෙන්නුම් කරයි.
4. චිත්‍රයට ගෝචර වූ පුද්ගලයා ලේඛන කලාවට දක්වන රුචිකත්වය පෙන්නුම් කරයි.
5. චිත්‍රයට ගෝචර වූ පුද්ගලයා මේ කිසිවක් සිදු නොකරන බව පෙන්නුම් කරයි. (.....)

# 12 ශ්‍රේණිය - චිත්‍ර I පත්‍රය
## II කොටස

- මෙය අනු කොටස් තුනකින් සමන්විතය.
- ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''අ'' ''ඉ'' කොටස් දෙකෙන් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
  (අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ)

## 'අ' කොටස
**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)**

01. ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල පිහිටා තිබෙන ස්වභාවික ගල්ගුහා සහ ආනත ගල් පර්වතවල මෙරට විසූ ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් අඳින ලදැයි සැලකෙන සිතුවම් හමු වී තිබේ.
    1. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් සිතුවම් අඳින ලද ස්වභාවික ගල්ලෙන් පිහිටි ස්ථාන දෙකක් නම් කරන්න. (ල. 2)
    2. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා තම සිතුවම් නිර්මාණය කිරීම සඳහා කුමණ හේතු පාදක කර ගන්නට ඇතිදැයි සාකච්ඡා කරන්න. (ල. 5)
    3. ශ්‍රී ලංකාවේ විවිධ ස්ථාන වලින් හමුවූ ප්‍රාග් ඓතිහාසික සිතුවම් නිරීක්ෂණය කිරීමේදී ඔවුන් විසින් භාවිතා කරන ලද වර්ණ, ප්‍රකාශනාත්මක ස්වරූපය සහ ඇඳීමේ ශිල්ප ක්‍රම පිළිබඳව විස්තර කරන්න. (ල. 8)

02. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ (ගෘහ නිර්මාණ අංග) අනුරාධපුර දිස්ත්‍රික්කය, කුරුණෑගල දිස්ත්‍රික්කය ආදී දිස්ත්‍රික්කවල විවිධ ස්ථානවලින් හමුවී ඇත.
    1. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ දෙකක් නම් කරන්න. (ල. 2)
    2. ඔබ නම් කරන ලද එක් වාස්තු විද්‍යා නිර්මාණයක් පිළිබඳව කෙටි සටහනක් ලියන්න. (ල. 5)
    3. එකල වැඩ විසූ භික්ෂූන් වහන්සේලාගේ සුවපහසුව සඳහා මෙම වාස්තු විද්‍යා අංගයන් ඉදිකර ඇතිබව නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 8)

03. මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කිරීමෙන් පසු මෙරට ඉතා කෙටි කාලයකින් බුදු දහමින් පෝෂණය විය. ඒ හේතු කොටගෙන බොහෝ කලා නිර්මාණ බිහිවන්නට විය.
    1. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන චෛත්‍ය හැඩ දෙකක් නිදසුන් සහිතව නම් කරන්න. (ල 2)
    2. ශ්‍රී ලංකාවේ ස්තූප හා ඉන්දීය සාංචි ස්තූපය අතර දක්නට ලැබෙන චෛත්‍ය අංග අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ල. 5)
    3. ශ්‍රී ලංකාවේ ස්තූපයේ ප්‍රභවය සිදු වූ ආකාරය පිළිබඳ නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 8)

## ‘ආ’ කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

04. ක්‍රි.පූ. 3000 දී පමණ ඉන්දියාවේ ජීවත් වූ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් වැසියන්, දියුණු තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් ඔවුනට අවශ්‍ය වූ සුවිශේෂී නිර්මාණ බිහිකරගත් පිරිසකි.

1. ඉන්දු නිම්නයෙන් හමුවූ කලා කෘති 2ක් නම් කරන්න. (ල. 2)
2. ඉන් නිම්නයෙන් හමුවූ එක් කලා කෘතියක් පිළිබඳව කලාත්මක ඇගයීමක් කරන්න. (ල. 5)
3. ඉන්දුනිම්න වැසියන් තුළ විවිධ වූ ආගමික ඇදහිලි හා විශ්වාස තිබූ බව එහිදී හමුවූ මුද්‍රා සහ මූර්ති ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 8)

05. ඉන්දීය ශ්‍රේෂ්ඨ නරපතියකු වූ අශෝක අධිරාජයා විසින් ගොඩනගන ලද බෞද්ධ ස්තූප අතර සාංචි ස්තූපයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

1. සාංචි ස්තූපයේ ගල් තොරණ්හි කැටයම් කර ඇති ජාතක කථා දෙකක් නම් කරන්න. (ල. 2)
2. සාංචි තොරණ්හි දක්නට ලැබෙන කැටයම් හි විශේෂ ලක්ෂණ කරුණු වශයෙන් දක්වන්න. (ල. 5)
3. අශෝක අධිරාජයා විසින් ගොඩනගන ලද ස්ථම්භයන්හි ආකෘතික ලක්ෂණ, තාක්ෂණික විශිෂ්ටත්වය සහ යොදා ගන්නා ලද මාධ්‍ය පිළිබඳව නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 8)

## ‘ඉ’ කොටස

## ( චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

06. ක්‍රි.පූ. 13වන සියවසේ නව රාජධානි සමයේ පාරාවන් විසින් ඉදිකරන ලද දැවැන්ත නිර්මාණ පිළිබඳව අදටත් ලොවට අභිරහසකි.

1. ඔබ දන්නා ඊජිප්තු දේවස්ථාන දෙකක් නම් කරන්න. (ල. 2)
2. ඉන් ඔබ කැමති එක් දේවස්ථානයක් පිළිබඳව වාස්තු විද්‍යාත්මක හා කලාත්මක අංග ලක්ෂණ පිළිබඳව විස්තර කරන්න. (ල 5)
3. මිසර (ඊජිප්තු) චිත්‍ර අතර දක්නට ලැබෙන ''කුරුළු දඩයම'' නැමති චිත්‍රය පිළිබඳව කලාත්මක ඇගයීමක් කරන්න. (ල. 8)

07. යුරෝපීය ප්‍රාග් ඓතිහාසික මානවයා තමා ජීවත් වූ පරිසරයේ දක්නට ලැබුණු දේ සහ සතුන් පිළිබඳව සිතුවම් ඔවුන් වාසය කළ ගල්ලෙන්වල ඇඳ ඇත. ඔවුන් තුළ පැවති සෞන්දර්ය ඥානය පිළිබඳ තොරතුරු රැසක් මේ තුළින් අනාවරණය කරගත හැක.

1. යුරෝපීය ප්‍රාග් ඓතිහාසික මානවයා සිතුවම් ඇඳි ස්ථාන දෙකක් නම් කරන්න. (ල. 2)
2. ස්පාඤ්ඤයට අයත් එක් ස්ථානයක් පිළිබඳව කෙටි සටහනක් ලියන්න. (ල. 5)
3. යුරෝපීය ප්‍රාග් ඓතිහාසික මානවයා සෞන්දර්ය ඥානයෙන් හෙබි අයෙකු බව සනාථ කිරීමට උදාහරණ දක්වමින් ඒ සඳහා පාදක වූ හේතු මෙන්ම, ඇඳීම සඳහා යොදාගන්නා ලද අමුද්‍රව්‍ය පිළිබඳව නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 8)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

51 S II

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................. චිත්‍ර II කාලය පැය තුනයි

**සැළකිය යුතුයි**

- ඔබේ විභාග අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව සටහන් කරන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට දෙන විට වියළී තිබිය යුතුය. තෙත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
- දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

## ස්වභාවිකත්ව අධ්‍යනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

- පහත සඳහන් කරුනු සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති පැළැටි සහිත ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න.
- කඩදසි තලය අර්ථවත්ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
- ද්‍රව්‍යවල හා පැළැටියේ ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස්මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝක රීතී පිළිබඳව සැලකිලිමත් වන්න.
- ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.
- ද්‍රව්‍ය සමූහයට ගැළපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.
- ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස්කර ගැනීමට හැකිය.
- දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිත කළ හැකිය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 51 | S | III |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................    චිත්‍ර III    කාලය පැය තුනයි

උපදෙස් :

- පහත සඳහන් ''අ'', ''ආ'' කොටස් තුනෙන් එක් කොටසක් තෝරාගන්න. එම කොටසේ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.
- චිත්‍රය භාරදෙන විට, එය වියළී තිබීම වැදගත් ය.
- ඕනෑම වර්ණ මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් හෝ මිශ්‍රිතව භාවිතා කළ හැකිය. (දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් යන මාධ්‍ය මිශ්‍රිතව භාවිතා කිරීමට නිදහස ඇත.)
- ඔබගේ විභාග අංකය හා තෝරාගත් ප්‍රශ්න අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසු පිටේ පැහැදිලිව ලියන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

- පහත සඳහන් තේමාවන්ගෙන් එකක් තෝරාගන්න තේමාවට උචිත ශෛලියකින් සිත්තම් කිරීමට අවසර ඇත.

01. ගම්මානයේ දොළපාර ළඟ නිසල පරිසරයක නිදහසේ සැරිසරන ගව රැළක්.
02. ජනාකීර්ණ වූ වීථියක විඩාපත් වූ පදික වෙළෙන්දෝ.
03. පාපන්දු ක්‍රීඩාවේ උද්වේගකර අවස්ථාවක්.
04. වයස්ගත වූ මවක් නහවා පිරිසිදු කරන දරු මුණුබුරු මිනිබිරියෝ.
05. ආගමික ස්ථානයක වතාවත්හි නිරතව සිටින බැතිමතුන් පිරිසක්.
06. හදිසි අනතුරකට ලක්වූ අයෙකුට උදව් කරන පිරිසක්

## ''ආ'' කොටස - සැරසිලි නිර්මාණ, මෝස්තර හා ග්‍රැෆික් සැලසුම්

07. සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර යොදා ගනිමින් මනාලියකගේ සාරියකට සුදුසු සාරි පල්ලුවක්.
08. කුඩා දරුවෙකුගේ ඇඳ ඇතිරිල්ලකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක්
09. මව් සෙනෙහස පිළිබිඹුවන ලෙස පුවත්පතක නිසදැසකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක්.
10. දේශීය පළතුරුවලින් සාදන ලද බීම වර්ගයක් ප්‍රචාරය කිරීම සඳහා සුදුසු ලේබලයක් ඇඳ වර්ණ කරන්න වර්ණ 4 කට සීමා කරන්න.

**<u>පළමු වාර පරීක්ෂණය 2019 චිත්‍ර කලාව II පත්‍රය - ආදර්ශ චිත්‍ර සටහන</u>**

**<u>முதலாம் தவணைப் பரீட்சை – 2019 சித்திரக்கலை – பகுதி II – மாதிரி பத்திரம்</u>**

**<u>12 ශ්‍රේණිය – தரம் 12</u>**

**<u>ஆசிரியருக்கு அறிவுறுத்தல்கள்</u>**

රූප සටහනේ දැක්වෙන පරිදි ද්‍රව්‍ය සැලසුම් කරන්න.

**අවශ්‍ය ද්‍රව්‍ය**

1. පොල් ගෙඩියක් මුඩ්ඩ සහිත
2. මාරි පෙට්ටියක්
3. කොටු සහිත රෙදි කැබැල්ලක්
4. සෙම්බුවක් (මැටි)
5. ක්‍රෝටන් අත්තක්
6. ආධාරක ලෑල්ලක්

படத்திலுள்ளவாறு பொருட்களை ஒழுங்குபடுத்துக.

- குடுமியுடன் கூடிய தேங்காய்
- மாரிபிஸ்கட் பெட்டி
- கோடுகள் கொண்ட துணித் துண்டு
- செம்பு குடம் (மண்)
- குரோட்டன் இலைகொப்பு
- ஆதாரப்பலகை



**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**පළමු වාර පරීක්ෂණය - 2019 - 12 ශ්‍රේණිය**
**චිත්‍ර කලාව I**
**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01 - 3 | 02 - 4 | 03 - 1 | 04 - 4 | 05 - 2 |
| 06 - 3 | 07 - 4 | 08 - 1 | 09 - 2 | 10 - 1 |
| 11 - 1 | 12 - 2 | 13 - 2 | 14 - 5 | 15 - 2 |
| 16 - 3 | 17 - 5 | 18 - 1 | 19 - 3 | 20 - 4 |
| 21 - 5 | 22 - 2 | 23 - 1 | 24 - 3 | 25 - 3 |
| 26 - 5 | 27 - 1 | 28 - 3 | 29 - 3 | 30 - 1 |
| 31 - 5 | 32 - 3 | 33 - 2 | 34 - 3 | 35 - 2 |
| 36 - 1 | 37 - 1 | 38 - 3 | 39 - 5 | 40 - 1 |

## II කොටස
### ''අ'' කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

01. (i) තන්තිරිමලේ / බිල්ලෑව / දොරවක් කන්ද / වෙට්ටම්බුගල / ආසියාගල / දිඹුලාගල / කඳුරු පොකුණ / අරන්ගොඩගල්ගේ / රජගල කන්ද / ගොනාගොල්ල / පිහිල්ලෙගොඩ/ අළුගල්ගේ / බුදුගල්ගේ / කුඩුම්බිගල / ලිහිණියාගල/ මගුල් මහා විහාරය / හක් බෙලිකන්ද / පියන්ගල

(ii) * එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගැනීම සඳහා
* දඩයම් සාර්ථක කර ගැනීමට
* සෞන්දර්‍යාත්මක අරමුණු ඉටුකර ගැනීම සඳහා
* ඔවුන්ගේ අභිචාර විධි හේතු කරගනිමින් ඇඳ ඇත
* ඔවුන් ජීවත්වන පරිසරයේ හු විෂමතාවය / විදේශ දේ අවධාරණය කිරීමට.

(iii) * ඔවුන් මෙම සිතුවම් සඳහා සුදු, අළු, රතු, කහ කළු යන වර්ණ භාවිතා කර ඇත.
* බහුලව දක්නට ලැබෙන්නේ සුදු සහ අළු නිර්මාණය කරන ලද රූ සටහන්ය.
* ඇතැම් සිතුවම් වර්ණ පදාස වලින් පුරවා ඇත.
* අලියා, කිඹුලා, පක්ෂීන් ආදී සතුන් ඇඳ ඇත.
* මිනිස් රූප නිර්මාණය කර ඇත.
* පින්තාරු කිරීම / බිත්ති සුරා නිර්මාණය කිරීම / මුද්‍රා තැබීම යනාදී ක්‍රම ශිල්ප භාවිතා කර ඇත.

02. (i) ආසනඝර / බෝධි ඝර / පධාන ඝර / උපෝසථඝර / ජන්තාඝර

(ii) * ආසනඝර - බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වන මොහොතේදී වැඩ සිටි ආසනය සංකේතවත් කරමින් තනා ඇති ආසනය මැදිකොට නිර්නමාණය කරන ලද ගොඩනැගිලි විශේෂයකි.
* මඩකලපුව - පුලුතුනාව / අනුරාධපුරයේ - කැබිතිගොල්ලෑවේ හල්මිට වැටිය ගමේ මෙවැනි ආසනඝර පිහිටා ඇත.
* බෝධිඝර - බෝධිය වටා එහි ආරක්ෂාවට මෙන්ම සක්මන් මළුව බිත්ති ප්‍රාකාරයකින් සමන්විත ගොඩනැගිල්ලකි.
* සතරැස් හා වෘත්තාකර හැඩවලින් මෙන්ම වෙනත් හාෂාවලින් යුතු බෝධිඝර දැකිය හැක.
* බෝධියේ ආරක්ෂාව, වෘක්ෂයේ වැඩීම පාලනය කිරීම. බැතිමතුන්ගේ ආරක්ෂාව අපේක්ෂා කෙරේ.
* කුරුණෑගල දිස්ත්‍රික්කයේ නීල්ලක්ගම බෝධිඝරය / පඬුවස්නුවර බෝධිඝරය / හම්බන්තොට පඩි කෙම්ගල බෝධිඝරය / ලාහුගල මගුල් මහා විහාර බෝධිඝරය ඉන් කිහිපයකි.

**පධානඝර**
* භාවනායෝගී භික්ෂූන් වෙනුවෙන් තනා ඇත.
* ''පියංගල'' යනුවෙන්ද හඳුන්වා ඇත.
* මෙය වටා ආරක්ෂාවට තනන ලද දිය අගලක් වේ.
* අරණ්‍යගත භික්ෂූන් වෙනුවෙන් ඉදිකර ඇත.
* ගල් තලාවකින් යාකර ඇති ආවාස කුටිය හා ඉදිරියේ විවෘත මණ්ඩපය ප්‍රධාන අංගයකි.

**උපෝසථඝර**
* භික්ෂූන්ගේ විනය කර්ම කිරීම සඳහා ගොඩනගන ලද ගෘහයකි.
* ලෝවාමහාපාය එවැනි ගොඩනැගිල්ලකි.
* නව මහල් ගොඩනැගිල්ලක්ව පැවති මෙම ගොඩනැගිල්ල දිගින් හා පළලින් එක සමානය.
* පියතිස්ස තඹ උළු වලින් සෙවිලිකොට තිබී ඇත.

**ජන්තාඝර**
* ආරාම වාසී භික්ෂූන්ට ස්නානය සඳහා යොදාගෙන ඇත.
* උණුසුම් ජලය ස්නානයට පහසුකම් සහිත ගොඩනැගිල්ලකි.
* හතරැස් ගොඩනැගිල්ලක් වූ මෙම ගොඩනැගිල්ල මධ්‍යයේ හතරැස් කුටියක් හා එහි මැද ජලය පිරවීම සඳහා වන තටාකයකි.
* මෙම කුටි ගල් පුවරුවලින් සකස් කර ඇත.
* අභයගිරිය / මහා විහාරය / මිහින්තලය / අරංකැලේ වැනි ස්ථානවල දැකගත හැක.

(iii) පධානඝර / උපෝසථාඝර / ජන්තාගර යන ඓතිහාසික වස්තු විද්‍යා අංග භික්ෂූන් වහන්සේලාගේ විවිධ කටයුතු සඳහා සහය ලබාදීම පිළිබඳව කරුණු දක්වා තිබීම කළ යුතුවේ.

03. (i) * බුබ්බුලාකාර - රුවන්වැලි සෑය * ථූපාරාමය - ඝණ්ටාකාර
* කැළණි විහාරය - ධාන්‍යාකාර
* රන්කොත් වෙහෙර - බුබ්බුලාකාර * කිරිවෙහෙර - බුබ්බුලාකාර
* හඟුරන්කෙත පොත්ගුල් විහාර චෛත්‍යය - බුබ්බුලාකාර

(ii) ශ්‍රී ලංකාවේ ස්ථූපවල ලක්ෂණ / ඉන්දීය සාංචි ස්ථූපයේ විශේෂ ලක්ෂණ
* පේසා වළලු තුනකි. * හතරැස් කොටුව * කොත් කැරැල්ල * කොත
* මේධිය පැවති ප්‍රදක්ෂිණ පථය * හර්මිකාව (ගල්ගරාදි වැට) * ශෛලමය යෂ්ටිය * ඡත්‍රය

(iii) * ප්‍රාග් බෞද්ධ යුගයේ ස්ථූප පිළිබඳව සඳහන් වේ.
උදා :- මහියංගන / කැළණිය / තිරියාය / මේම සඳහා නිත්‍ය වූ මූලාශ්‍ර හඳුනාගෙන නැත.
* මිහිදු හිමියන්ගේ වැඩමවීමෙන් පසුව ලබාදුන් උපදෙස් මත දෙවන පැතිස් රජු ථූපාරාමය ඉදිකරයි.
* සාංචි ස්ථූපයේ ආභාසය ලබා තිබීම ලක්දිව චෛත්‍යයේ ප්‍රභවය කෙරෙහි බලපා ඇති බව සඳහන් විය යුතුය.

04. (i)* පිරිමි කවන්ධ රුව / නර්තන විලාසය දැක්වෙන / පිරිමි කවන්ධ රූ / පූජක රුව / ලෝකඩමුවා නළඟන රුව / මාතෘ දෙවඟන මූර්තිය / මුද්‍රා / මැටි බඳුන් සහ ආභරණ

(ii) **පිරිමි කවන්ධ රුව**
* හරප්පාවෙන් හමුවූ පූර්ණ උන්නත මූර්තියයි.
* රතු වැලිගලින් හමුවූ මෙය සෙන්ටිමීටර් 10ක් පමණ උස් වූ නග්න රූපයකි.
* හිස සහ අත්පා රහිත මූර්තියකි. වෙන වෙනම අත් පා සවි කොට තිබී ඇත.
* අඟ පසඟ පරිමානුකූල වේ. පෙරදිග මානව රූපවල ලක්ෂණ පෙන්වයි.
* මානව දේශයේ සුන්දරත්වය ඉතා අලංකාරව ලෙස පෙන්වා ඇත.

**නර්තන විලාශය පෙන්වන කවන්ද රූපය**
* නිරුවත් රුවකි / අළු වැලිගලෙන් නෙලා ඇත. සෙන්ටිමීටර් 10 ක් පමණ උසය.
* රිද්මානුකූල ඉරියව්වක් පෙන්වන මෙහිද හිස හා අත්පා නැත.
* ශිව තාණ්ඩව නැටුම මෙයින් නිරූපණය කරන බව ''පිගොට්'' පවසා ඇත.

**පූජක රුව**
* $17\frac{1}{2}$ **cm** ක් උස, සුදු හුණුගලෙන් නිමවා ඇති මොහෙන්ජොදාරෝවෙන් හමුවූ පුරුෂ උඩුකය රූපයයි.
* ශෛලිගත ස්වභාවයෙන් නිර්මාණය කර ඇත.
* හිසවටා ගාංචුවක් යෙදූ පටියකි. මෙම උර වැසෙන සේ යොදන ලද වස්ත්‍රය තුන් පෙති මලින් සරසා ඇත.
* ඒකාංශව යෙදූ සළුව, අඩවන් දෙනෙත් / මුඩු කළ හිස (අඩක්) නිසා මෙය පූජකරුවක් විද්වත් මතයයි.
* මොංගෝලියානු මානව ලක්ෂණ දක්නට ඇත.

**මව් දෙවඟන**
* ටෙරා කොටා රූප අතර හමුවී ඇත. * ප්‍රමාණයෙන් කුඩා වුවද ප්‍රාථමික ලක්ෂණ ප්‍රකට කෙරේ.
* පුළුල් උකුල/ පියයුරු මතුවී පෙනේ ආභරණ තුළින් සරසා ඇත.

**මුද්‍රා**
* ඉන්දු නිම්නයෙන් හමුවූ මුද්‍රා සංඛ්‍යාව 2000 ට වඩා හමුවී ඇත. වැසියන්ගේ දියුණු කලාත්මක හැකියාව. පෙන්වයි/ සත්ව සංකේත හා මානව රූප දැකගත හැක.
* උන්නත හා ගිලුණු යන ක්‍රම දෙකම කැටයම් නිර්මාණය කර ඇත.
* අදාළ තොරතුරු සළකා බලා ලකුණු පිරිනමන්න.

(iii) * පූජක රුව හමුවීමෙන් කිසියම් ආගමක් ඇදනු බව.
* නලගණ රුව කිසියම් නර්තන විලාශයක ස්වරූපය පෙන්වයි.
* ඔවුන් විසින් නිම කරන ලද මුද්‍රා ඇසුරින් මෙම ජනතාව ආගමික ඇදහිලි විශ්වාස පිළිගත් බව සනාථවේ. මාතෘ දෙවඟන මූර්තිය ඇසු තුළින් මාතෘ මූලික සමාජයක් පැවති බව සනාථ වේ. ඔවුන්ගේ යන්ත්‍ර මන්ත්‍ර සඳහාද මෙම මුද්‍රා යොදාගෙන ඇත.
* පශුපති මුද්‍රාව සහිත මුද්‍රාවෙන් කිසියම් දෙවියකු පිළිබඳව මුහුණු තුනක් දක්වයි. ශිව සංකේතය හිස මත අං දෙක අතර ත්‍රිශූලය මඟින් පෙන්වා ඇත.
* වෘක්ෂ වන්දනාව දැක්වෙන මුද්‍රාව තුලින් ඉන්දු නිම්නයේ වෘක්ෂ වන්දනාව පැවති බව පෙනේ.
* ව්‍යාඝ්‍රයකු හා සටන්වදින අං සහිත මිනිසා මුද්‍රාවෙන් වෘක්ෂ දේවතාවකු පිළිබිඹු කරයි. වෘක්ෂ වන්දනාව සනාථ කරයි.
* කරුණු සලකා බලා ලකුණු පිරිනමන්න.

05. (i) වෙස්සන්තර ජාතකය / ඡද්දන්ත ජාතකය / මහා කපි ජාතකය

(ii) * කණුවල හතරැස් හා දිගටි ජනේලද තිරස් පුවරුවල හරස් අතට විහිදී ගිය තීරු ජනේලද කැටයම් කර ඇත.
* එක පනේලයක් තුල එක් පුවතක අවස්ථා කිහිපයක් දක්වා තිබේ.
* අඛණ්ඩව කථන මාධ්‍යය භාවිතා කර ඇත.
* කථාවේ වැදගත් අවස්ථා කිහිපයක් එකට ගලායන ආකාරයට කැටයම්කර තිබේ. වෙන් කොට දැක්වීම උත්සහ ගෙන නැත.
* වමේ සිට දකුණට කථාව කියාගෙන යන ආකාරයට කැටයම් කර ඇති අතර දකුණේ සිට වමටද කථාව කියවෙන ආකාරයට කැටයම් කර ඇත.
* සතුන්, මිනිසුන්, ගස් නිර්මාණය කර ඇත්තේ තමාට ආවේණික රටාවකටය.
* තාත්විකව පෙන්වීම වෙනුවට නිර්මාණාත්මක රටාවක් යොදා ගෙන ඇත.
* ගස් ගංගා ආදිය පෙන්වීමේදී ශෛලිගත ස්වභාවයක් පෙන්වයි.
* බුදුන්වහන්සේගේ රූප කාය වෙනුවට සංකේත භාවිත කර ඇත.
* ප්‍රාණ පූර්ණ බවින් යුතු කැටයම් සඳහා ශිල්පියාගේ ස්වීයත්වය බලපා ඇත.
* රූපයකට රූපයක් මුවාවන ආකාරයට කැටයම් නිමවා ඇත.
* භාරුත් කැටයම්වලට වඩා ගැඹුරට හාරා ඇත.
* මෙසපොතේමියානු සහ පර්සියන් ආභාෂය ලබා ඇති බවද දක්නට ඇත.

(iii) අශෝක ස්ථම්භ අතරින් මේවන විට ඉතිරිව ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි.

ආකෘතික ලක්ෂණ ලෙස,

* මෙම කුළුණු දුඹුරු පැහැති වැලි ගලින් නිමකර ඇත.
* ටැම් හිස සහ කඳ වශයෙන් කොටස් දෙකකින් යුතුවේ.
* පාදමකින් තොරව පොළොවේ ගැඹුරට සිටුවා ඇත.
* හිස කොටස ඝණ්ටාව, කවාකාර, සතරැස් ශීර්ෂ තලය සහ ඒ මත ඇති සත්ව රූපය යන කොටස්වලින් යුතුවේ.
* සිලින්ඩරාකාර කඳ ඉහළට යනවිට ක්‍රමයෙන් කුඩාවේ. ඉතා සියුම්ව ඔපදමා ඇත.
* ශීර්ෂ තලය වටා සත්ව රූප ධර්ම චක්‍ර ආදිය කැටයම්කර ඇත.
* අඩි 30 - 50 පමණ උස්වන අතර ටොන් 40 - 50 බරෙන් යුතුවේ.
* මාධ්‍ය ලෙස කළුගල් යොදාගෙන තිබේ.
* අදාළ නිදර්ශන යොදා තිබිය යුතුයි.

06. (i) * අබුසිම්බල් දේවස්ථානය * ලුක්සෝර් / ලක්සෝර් දේවස්ථානය

(ii) **අබුසිම්බල් දේවස්ථානය**

* නව රාජධානි සමයේ දෙවන රැමෙසස් රජු විසින් ඉදිකර ඇත.
* 13 වන සියවසට අයත් දැවැන් ශෛලමය දේවස්ථානයකි.
* ජ්‍යාමිතික හැඩතල බහුල මෙම දේවස්ථානය ඉදිරිපිට විශාල ප්‍රමාණයේ ශෛලමය මූර්ති 04ක් දක්නට ඇත.
* එක් ප්‍රතිමාවක උස මීටර් 20ක් පමණ වේ. ප්‍රතිමාවේ පාද අසල බිරිය, කුමරකුගේ සහ කුමරියකගේ මූර්ති ඇත.
* සූර්ය දිව්‍ය සංකල්පයට සම්බන්ධව ගොඩනගන ලද දේවස්ථානයකි. අස්වාන් වේල්ල ඉදිකිරීම නිසා මෙහි කොටස් ගලවා වෙනත් තැනක ඉදිකර ඇත.
* සූර්ය දිව්‍ය සංකල්පයට සම්බන්ධව ගොඩනගන ලද දේවස්ථානයකි. අස්වාන් වේල්ල ඉදිකිරීම නිසා මෙහි කොටස් ගලවා වෙනත් තැනක ඉදිකර ඇත.

(iii) **කුරුළු දඩයම**

* තීබ්ස්හි නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවන මෙම සිතුවමින් වංශාධිපතියකු ස්වකීය බිරිය සහ දියණිය සමඟ වගුරු බිමක පක්ෂි දඩයමේ යෙදී සිටින ආකාරය දැක්වේ.
* මෙහි පාරාවෝවරයාගේ රූපය සෙසු සියලු රූපවලට වඩා විශාලව ඇඳ තිබේ. ඔවුන් සියලු දෙනාම සැහැල්ලු බෝට්ටුවක නැගී සිටී.
* මෙම සිතුවම ක්‍රි.පූ. 1400ට පමණ අයත්වේ. පාරාවෝවරයාගේ එක් අතක අල්ලාගත් පක්ෂීන් සහ අනෙක් අතෙහි හුමරංගයක් දක්නට ඇත.
* සියලුම රූප ඇඳ ඇත්තේ පැතලි පෙනුම සිටින ලෙසය. පැතලි ලෙස වර්ණ තවරා ඇත.
* පාරාවෝවරයාගේ බළලා ද කුරුල්ලන් දඩයම් කිරීමේ යෙදී සිටින අතර මෙම සිතුවමෙහි සත්ව රූප ඇඳ ඇත්තේ ස්වභාවික ලක්ෂණ දැක්වෙන අයුරිනි. චිත්‍ර සඳහා සීමිත වර්ණ මාලාවක් භාවිතා කර ඇත.

07. (i) * ලැස්කෝ / ඇල්ටමීරා / චෝවේ (ෂෝවේ) / පොන්ඩිගෝම්/ දොර දෝන්

(ii) * ඇල්ටමීරා

* ක්‍රි.පූ. 15000 ට පමණ අයත් මෙම ගුහාව උතුරු ස්පාඤ්ඤයේ පිහිටා ඇත.
* මෙම ගුහාවේ ඉහල ගල්තලය සහ සියළුම බිත්ති ආවරණයවන ආකාරයට සිතුවම් ඇඳ ඇත.
* සත්ව රූප, ජ්‍යාමිතික හැඩතල, විවිධ සංකේත සහ මුද්‍රිත අත් සලකුණු සිතුවම්කර ඇත.
* බයිසන් ගවරුව මෙහි වඩාත් ව්‍යාප්ත තේමාවය. ලගින, දුවන, පනින, ගමන් කරන, සිටගෙන සිටින, ඉරියව්වලින් බොහෝ බයිසන් ගව රූප ඇඳ ඇත.

(iii)* යුරෝපීය ප්‍රාග් ඓතිහාසික මානවයා ගුහා තුල සිතුවම් නිර්මාණය කිරීමේදී විශේෂකරණ කිහිපයක් පාදක කරගෙන ඇතිබව පෙනේ. දඩයම් සුලභ කර ගැනීම / විවේකය ගත කිරීම / භූතාත්ම පිදීම / දඩයම් පහසු කර ගැනීම යනාදි කරුණු වේ.

* පරිසරයේ තමා දකින දේ සෞන්දර්යාත්මකව නිර්මාණය කිරීමට පෙළඹී ඇත. උදා :- ලැස්කෝ ගුහාවේ සිතුවම් ඇල්ටමීරා ගුහාවේ සිතුවම් / සඳහන් කළ හැක.
* චිත්‍ර ඇඳීම සඳහා ඔවුන්ට ඉතා සමීප පරිසරයේ අමුද්‍රව්‍ය යොදාගෙන ඇත. සත්ව ලේ / සත්ව තෙල් / අළු / අඟුරු/ පස් / ශාක කොටස් භාවිතා කර ඇත.
* වර්ණ මිශ්‍ර කර සිතුවම් ඇඳීමද දක්නට ලැබේ. මේ නිසා ආදී මානවයා තුළ සෞන්දර්යාත්මක හැඟීම් තිබූ බව සනාථ වේ.


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
GUIDE PAST PAPERS
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440